සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
අවසාන වාර පරීක්ෂණය 2016

10 ශ්‍රේණිය 60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (නව නිර්දේශය) - I කාලය පැය 01 යි.

නම/ විභාග අංකය:

උපදෙස් :
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට

- පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක 1 සිට 04 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මිනිස් අවශ්‍යතා මත ඇතිවන විවිධ වූ වුවමනාවන් සපුරාලීමට අවශ්‍ය භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම හෝ සැපයීම ආශ්‍රිත ආර්ථික කටයුත්තක් ව්‍යාපාරයක් ලෙස හැඳින්වේ. සන්නිවේදන හා තාක්ෂණ ක්ෂේත්‍රයේ සීඝ්‍ර දියුණුවක් සමග මුළු ලෝකයම විශ්ව ගම්මානයක් බවට පත්ව ඇත. එය මිනිසුන්ගේ දෛනික අවශ්‍යතා හා වුවමනා වර්ධනය වීමට ද හේතු වී ඇත. ඒ අනුව මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීමේ යාන්ත්‍රණයක් ලෙස විවිධ වූ ව්‍යාපාර සංවිධාන ක්‍රම රාශියක් බිහිවෙමින් පවතී.

01. විවිධ ව්‍යාපාර සංවිධාන ක්‍රම බිහිවීමට බලපෑ මූලික සාධකය වනුයේ,
(1) විශ්ව ගම්මානයක් වීමය. (2) අවශ්‍යතා හා වුවමනාය
(3) තාක්ෂණික දියුණුවය (4) භාණ්ඩ හා සේවාය

02. මිනිස් අවශ්‍යතාවල ලක්ෂණයක් නොවන්නේ,
(1) පොදු වීම (2) අත්‍යවශ්‍ය වීම (3) නිර්මාණය කල හැකි වීම (4) සීමිත වීම

03. නිෂ්පාදනය සඳහා අවශ්‍ය නිෂ්පාදන සාධක සංවිධානය කරමින් යම් නිෂ්පාදන ක්‍රියාවලියක් ආරම්භ කර පවත්වාගෙන යාමේ කාර්ය හඳුන්වනු ලබන්නේ,
(1) කළමනාකරණය (2) අලෙවිකරණය (3) ව්‍යවසාය (4) නිෂ්පාදනය

04. A සිට F දක්වා දී ඇති අවශ්‍යතා හා වුවමනා නිවැරදිව කාණ්ඩ දෙකකට වෙන්කළ විට ලැබෙන පිළිතුර තෝරන්න.

A - ආහාර
B - බස්රථ
C - සන්නිවේදනය
D පෞද්ගලික අධ්‍යාපනය
E - ආරක්ෂාව
F - රෝහල

	අවශ්‍යතා	වුවමනා
(1)	A, C, E	B, D, F
(2)	A, C, D	B, E, F
(3)	A, C, F	B, D, E
(4)	A, D, F	B, C, F

05. ව්‍යාපාරයක ව්‍යාපාර සැලසුම් නිසි ලෙස ක්‍රියාත්මක කර නිවැරදි තීරණ ගැනීමේ කාර්ය ඉටු කිරීම සඳහා දායකත්වය දෙනු ලබන්නේ,
(1) කළමණාකරුවන්ය. (2) සේවකයන්ය. (3) අයිතිකරුවන්ය. (4) තරඟකරුවන්ය.

06. රජය විසින් VAT බදු ප්‍රතිශතය 11% සිට 15% දක්වා ඉහළ දැමීම කුමන පරිසර සාධකයට අයත් වේද?

(1) නෛතික පරිසරය (2) දේශපාලන පරිසරය (3) ආර්ථික පරිසරය (4) ගෝලීය පරිසරය

07. ඒක පුද්ගල ව්‍යාපාරයක, ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත ඉදිරිපත් කළ යුත්තේ ආරම්භ කර කොපමණ කාලයක් ඇතුලත ද?

(1) දින 07 (2) දින 14 (3) දින 21 (4) දින 30

08. ඒක පුද්ගල ව්‍යාපාර හා හවුල් ව්‍යාපාරවල දැකිය නොහැකි එහෙත් සීමිත සමාගම්වල දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,

(1) අරමුණක් තිබීම (2) ආර්ථික කටයුත්තක නියැලීම

(3) නෛතික පුද්ගල භාවයක් පැවතීම (4) පැවැත්මක් තිබීම

09. සීමිත සමාගම් ලියාපදිංචි කළයුතු පනත වන්නේ,

(1) 1918 අංක 06 දරන ව්‍යාපාර නාම ආඥා පනත (2) 1972 අංක 05 දරන සමූපකාර සමිති පනත

(3) 2007 අංක 07 දරන සමාගම් පනත (4) 1890 හවුල් ආඥා පනත

10. ව්‍යාපාරයක කළමනාකරණ කටයුතු පුද්ගලයන් කිහිපදෙනෙකු මගින් සිදුකර ගැනීමට අපේක්ෂා කරන්නේ නම්, තෝරා ගත යුතු ව්‍යාපාර සංවිධාන ක්‍රම වන්නේ,

(1) හවුල් ව්‍යාපාර හා තනි පුද්ගල ව්‍යාපාර (2) හවුල් ව්‍යාපාර හා සංස්ථාපිත සමාගම

(3) සංස්ථාපිත සමාගම් හා තනි පුද්ගල ව්‍යාපාර (4) තනි පුද්ගල ව්‍යාපාර හා සමිති සංවිධාන

11. ලී බඩු අලෙවි ව්‍යාපාරයක හිමිකරු තම නිවසේ ප්‍රයෝජනය සඳහා විකිණීමට ඇති ලී බඩු වලින් කොටසක් රැගෙන යයි. මෙම ගනුදෙනුව සටහන් කළ යුතු මූලික පොත වන්නේ,

(1) මුදල් පොත (2) ගැනුම් ජ' නලය (3) විකුණුම් ජ'නලය (4) පොදු ජ'නලය

12. පහත A තීරුවේ මූලික සටහන් පොත් දැක්වෙන අතර ඒවායේ ගනුදෙනු සටහන් කිරීමට උපයෝගී කර ගන්නා මූලාශ්‍ර ලේඛන B තීරුවේ දැක්වේ.

A		B
මුදල් පොත	P	ජ'නල වවුචරය
විකුණුම් ජ'නලය	Q	තැන්පත් කිරීමේ කුවිතාන්සිය
පොදු ජ'නලය	R	ලදුපත
බැංකු ගිණුම	S	විකුණුම් ඉන්වොයිසිය

A හා B තීරු නිවැරදිව ගැලපූ විට අදාල නිවැරදි පිළිතුර වනුයේ,

(1) RSPQ (2) PSQR (3) RQSP (4) SPQR

13. බැංකු ණය ගිණුම් ගත කිරීමට අදාළ ද්විත්ව සටහන වන්නේ,

(1) මුදල් ගිණුම හර
බැංකු ණය ගිණුම බැර

(2) ණයගැති ගිණුම හර
බැංකු ගිණුම බැර

(3) මුදල් ගිණුම හර
ණයහිමි ගිණුම බැර

(4) ණයහිමි ගිණුම හර
බැංකු ගිණුම බැර

14. පහත සඳහන් ගනුදෙනු අතරින් මුදල් පොතේ සටහන් කරන ගනුදෙනුවක් වන්නේ,

(1) රු. 1200 ක භාණ්ඩ ගැනිලි සිදු කිරීම (2) රු. 3000 ක භාණ්ඩ අනිල්ගෙන් ගැනීම

(3) රු. 5000 ක් වටිනා කාර්යාල උපකරණ ණයට ගැනීම (4) රු. 5000 ක් අත්පිට විකුණුම් වලින් මුදල් ලැබීම

15. රාණිගේ ව්‍යාපාරයෙහි ණය ගැතියකු වූ සම්පත් විසින් රු. 25000 ණය මුදලක් පියවීමේ දී 5% වට්ටමක් ලබා ගන්නා ලදී. මෙය සම්පත් ගේ ව්‍යාපාරයේ,

(1) රු. 1250 ක දුන් වට්ටමකි. (2) රු. 1250 ක ලද වට්ටමකි.

(3) රු. 25000 ක දුන් වට්ටමකි. (4) රු. 25000 ක ලද වට්ටමකි.

The National e-learning Portal for the General Education

16. කමණිගේ ව්‍යාපාරයේ ජනවාරි 31 දිනට සුළු මුදල් භාරකරු ළඟ ඉතිරි මුදල වනුයේ රු. 350 කි. පෙබරවාරි 01 දින සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීම සඳහා රු. 3650 ක් ප්‍රධාන මුදල් භාරකරු විසින් සුළු මුදල් භාරකරුට ලබාදෙන ලදී.

මෙම ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය වන්නේ,

(1) රු. 350 (2) රු. 4000 (3) රු. 3650 (4) රු. 3350

17. පහත දැක්වෙන අරමුණු අතරින් ගිණුම්කරණයේ මූලික අරමුණ සේ පිළිගත හැක්කේ,

(1) මූල්‍ය තත්වය මැන බැලීම (2) ලාභදායිත්වය මැන බැලීම

(3) නෛතිකමය අවශ්‍යතා ඉටු කිරීම (4) ඇල්මැති පාර්ශවයන්ගේ තොරතුරු අවශ්‍යතා ඉටු කිරීම.

18. පහත තොරතුරු සපයා ඇත.

A - ව්‍යාපාරය විසින් පාලනය කිරීම

B - බේරුම් කිරීමේ දී ව්‍යාපාරයේ සම්පත් වලින් කොටසක් පිටතට ගලා යාම

C - වර්තමාන බැඳීමක් තිබීම

D - වටිනාකම විශ්වාසනීය ලෙස මැනිය හැකිවීම

ඉහත කරුණු අතරින් වත්කමක ලක්ෂණ පමණක් නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) A හා B (2) A හා D (3) B හා C (4) B හා D

19. අයිතිකරුවන් යොදන ප්‍රාග්ධනය නිසා හිමිකමෙහි සිදුවන වැඩිවීම් හැර හිමිකමෙහි සිදුවන අනෙකුත් වැඩිවීම්......,

(1) වියදම් ලෙස හැඳින් වේ (2) ගැනිලි ලෙස හැඳින්වේ

(3) ආදායම් ලෙස හැඳින්වේ (4) වත්කම් ලෙස හැඳින්වේ

20. සජාන්ගේ ව්‍යාපාරයේ 2016 වර්ෂයට අදාළව පහත තොරතුරු සපයා ඇත.

2016 01 01 දිනට ප්‍රාග්ධනය	රු. 565000
වර්ෂයේ ආදායම්	රු. 356000
වර්ෂයේ වියදම්	රු. 250000
වර්ෂය තුළ අයිතිකරු යෙදූ මුදල්	රු. 125000

2016 12 31 දිනට අයිතිකරුගේ හිමිකම වනුයේ,

(1) රු. 796 000 කි (2) රු. 690 000 කි (3) රු. 671 000 කි (4) රු. 921 000 කි

21. යම්කිසි ව්‍යාපාරයක 2016 01 01 දිනට ගිණුම්කරණ සමීකරණය පහත දැක්වේ.

වත්කම් = හිමිකම් + වගකීම්

250 000 = 150 000 + 100000

ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 300 000 ක් වටිනා යන්ත්‍රයක්, රු. 150 000 ක් ගෙවා ඉතිරිය ණය පදනමට ලබා ගන්නා ලදි. එවිට ගිණුම්කරණ සමීකරණයේ අගය නිවැරදිව දැක්වෙනුයේ,

	වත්කම් (රු)	=	හිමිකම් (රු)	+	වගකීම් (රු)
(1)	400 000	=	150 000	+	250 000
(2)	400 000	=	300 000	+	100 000
(3)	550 000	=	300 000	+	250 000
(4)	450 000	=	150 000	+	300 000

ඊ-තක්සලාව - The National e-learning Portal for the General Education

22. යම්කිසි ව්‍යාපාරයක වත්කමක් වැඩිවීම හා වගකීමක් වැඩිවීමට අදාළ ගනුදෙනුව වන්නේ,

(1) අයිතිකරු විසින් රු. 100 000 ක මුදලක් ව්‍යාපාරයට යෙදවීම.

(2) ණයගැතියෙකුගෙන් රු. 25 000 ක මුදලක් ලැබීම.

(3) රු. 150 000 ක බැංකු ණයක් ලබාගැනීම

(4) ණයහිමියෙකුගේ ණය පියවීමට රු. 50 000 ක ලිබඩු ලබා දීම

23. ණයගැතියෙකු තම ණය පියවීම සඳහා මුදලින් රු. 50 000 ක් ද රු. 25 000 ක් වටිනා දුරකථනයක් ද ව්‍යාපාරයට ලබා දීම නිසා ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම නම්,

(1) වත්කම් රු. 75 000 කින් වැඩිවීම හා ව්‍යාපාරයේ හිමිකම් රු. 50 000 කින් වැඩිවීමයි.

(2) ව්‍යාපාරයේ වත්කම් රු. 50 000 කින් වැඩිවීම හා ව්‍යාපාරයේ හිමිකම් රු. 50 000කින් වැඩිවීමයි

(3) ව්‍යාපාරයේ වත්කම් රු. 75 000කින් අඩු වීම හා වත්කම් රු. 75 000 කින් වැඩිවීමයි

(4) ව්‍යාපාරයේ හිමිකම් රු. 75 000 කින් වැඩිවීම හා වත්කම් රු. 75 000 කින් වැඩි වීමයි

24. " ගිණුම් සියල්ලම ඇති ස්ථානය ලෙජරයයි" ලෙජරයේ ගිණුම් රාශියක් තිබුණ ද එහි ඇති ගිණුම් වර්ග,

(1) තුනකි (2) හතරකි (3) පහකි (4) හයකි

25. ගැනිලි ගිණුම හර කිරීමට හේතුව වන්නේ,

(1) වියදම් වැඩිවීම හර නිසාය (2) වත්කම් වැඩිවීම හර නිසාය

(3) හිමිකම් අඩුවීම හර නිසාය (4) ආදායම් වැඩිවීම හර නිසාය

26. බැංකු ජංගම ගිණුමේ පවතින මුදල් ප්‍රමාණය ඉක්මවා චෙක්පත් නිකුත් කළ විට, බැංකු ගිණුමේ ඇතිවන බැර ශේෂය හැඳින්වෙනුයේ,

(1) චෙක්පත් නිෂ්කාශණය ලෙසය (2) චෙක්පත් අගරුවීම ලෙසය

(3) බැංකු අයිරාව ලෙසය (4) බැංකු ප්‍රකාශය ලෙසය

27. කමල්ගේ ව්‍යාපාරයේ ණයගැතියෙකුගෙන් ලද රු. 50 000 ක චෙක්පත බැංකුවේ තැන්පත් කලපසු අගරු වූ බව දැනුම් දෙන ලදී. මෙම චෙක්පත අගරුවීමට අදාල ද්විත්ව සටහන වනුයේ,

(1) බැංකු ගිණුම හර 50 000
ණයගැති ගිණුම බැර 50 000

(2) ණය ගැති ගිණුම හර 50 000
බැංකු ගිණුම බැර 50 000

(3) මුදල් ගිණුම හර 50 000
ණයගැති ගිණුම බැර 50 000

(4) ණයගැති ගිණුම හර 50 000
මුදල් ගිණුම බැර 50 000

- පහත සඳහන් තොරතුරු ඇසුරෙන් 28, 29 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

ව්‍යාපාරයක 2016 03 31 දිනට බැංකු ගිණුමේ හර ශේෂය රු. 110 000 ක් විය. එදින බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය මීට වඩා වෙනස් විය. වෙනසට පහත කරුණු බලපාන ලදී.

- ★ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවු චෙක් රු. 4 000 කි.
- ★ නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් රු. 5 000 කි.
- ★ බැංකුව වෙත ලද ණයගැති සෘජු ප්‍රේෂණ රු. 16 000 කි.
- ★ ස්ථාවර නියෝග මත ගෙවූ රක්ෂණ ගාස්තු රු. 2 000 කි.

28. 2016 03 31 දිනට සංශෝධිත බැංකු ගිණුමේ ශේෂය වනුයේ,

(1) රු. 124 000 (2) රු. 116 000 (3) රු. 126 000 (4) රු. 150 000

29. 2016 03 31 දිනට බැංකු ප්‍රකාශනයට අනුව ශේෂය කොපමණ ද?

(1) රු. 108 000 (2) රු. 120 000 (3) රු. 125 000 (4) රු. 124 000

30. ගෘහ භාණ්ඩ අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන නිමල් විසින් රු. 500 000 ක් වටිනා ගෘහ භාණ්ඩ ණයට මිලදී ගන්නා ලදී. මෙම ගණුදෙනුව සටහන් කිරීමට අදාල මූලාශ්‍ර ලියවිල්ල හා මූලික සටහන් පොත වනුයේ,

(1) ලදුපත හා මුදල් පොත (2) වවුචරය හා ගැනුම් ජ'නලය
(3) ඉන්වොයිසිය හා ගැනුම් ජ'නලය (4) ඉන්වොයිසිය හා විකුණුම් ජ'නලය

31. නිමි ඇඳුම් අලෙවි ව්‍යාපාරයක් පවත්වාගෙන යන යුවති විසින් රු. 25 000 ක් වටිනා නිමි ඇඳුම් තොගයක් ණයට මිලදී ගන්නා ලදී. මෙම ගනුදෙනුව ලෙජරයට පිටපත් කිරීමේ නිවැරදි ද්විත්ව සටහන තෝරන්න.

(1) ගැනුම් ගිණුම හර 25 000
ණය හිමියෝ බැර 25 000

(2) ණය හිමියෝ හර 25 000
ගැනුම් ගිණුම බැර 25 000

(3) නිමි ඇඳුම් ගිණුම හර 25 000
ණය හිමියෝ බැර 25 000

(4) ගැනුම් ගිණුම හර 25 000
මුදල් පොත බැර 25 000

32. ගිණුම් කාලච්ඡේදයක් අවසානයේ විකුණුම් ජ'නලයේ එකතුව ලෙජරයට පිටපත් කිරීමේ ද්විත්ව සටහන නිවැරදිව දක්වෙන වරණය තෝරන්න.

(1) ණය හිමියෝ හර
විකුණුම් බැර

(2) ණයගැතියෝ හර
විකුණුම් බැර

(3) විකුණුම් හර
ණය හිමියෝ බැර

(4) විකුණුම් හර
ණයගැතියෝ බැර

33. කුසුම්සිරි විසින් තම ව්‍යාපාරයේ පාවිච්චිය සඳහා රු. 500 000 ක් වටිනා මෝටර් රථයක් සීමිත ඉන්ද්‍රා සමාගමෙන් ණයට ගන්නා ලදී. මෙම ගනුදෙනු සටහන් කරන මූලික සටහන් පොත වනුයේ,

(1) මුදල් පොතය (2) ගැනුම් ජ'නලය (3) විකුණුම් ජ'නලය (4) පොදු ජ'නලය

34. බැංකු සේවාවක කාර්යයන් කිහිපයක් පහත දක්වා ඇත.

A බැංකු ගිණුම් ශේෂය පිරික්සීම
B බැංකු ගිණුමේ මුදල් තැන්පත් කිරීම
C විදුලි බිල්පත් හා ජල බිල්පත් ගෙවීම
D චෙක් පොත් සඳහා අයදුම් කිරීම

ඉහත කාර්යයන් අතරින් ටෙලි බැංකු සේවාවක් තුලින් ඉටුකර ගත හැකි කාර්යයන් පමණක් ඇතුලත් පිළිතුර වනුයේ,

(1) A, B හා C ය (2) A, C හා D ය (3) B, C හා D ය (4) ඉහත සියල්ලමය.

35. යම් කාලච්ඡේදයක් අවසානයේ දී ලෙජර් ගිණුම්වල හර ශේෂ සහ බැර ශේෂ වෙන වෙනම තීරු දෙකක ඇතුලත් කර පිළියෙල කරන ලැයිස්තුව හැඳින්වනුයේ,

(1) ආදායම් ප්‍රකාශය යනුවෙනි (2) ශේෂ පත්‍රය යනුවෙනි
(3) ලෙජරය යනුවෙනි (4) ශේෂ පිරික්සුම යනුවෙනි

National e-learning Portal for The General Education

- **පහත තොරතුරු ඇසුරින් අංක 36 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

දිල්ෂාන් විසින් 2015 04 01 දින ක්‍රීඩා භාණ්ඩ අලෙවි කරන ව්‍යාපාරයක් ආරම්භ කරන ලද අතර ව්‍යාපාරයේ 2016 03 31 දිනට ව්‍යාපාරයේ පොත් වලින් උපුටාගත් ශේෂ පිරික්සුම පහත දැක්වේ.

ගිණුම	හර (රු.)	බැර (රු.)
ඉඩම	400 000	
ගොඩනැගිලි	450 000	
ණයගැතියෝ	120 000	
මුදල්	190 000	
ගැනුම්	175 000	
ගැනිලි	45 000	
වේතන	36 000	
විදුලිය	80 000	
දුරකථන	4 000	
ප්‍රාග්ධනය		750 000
විකුණුම්		250 000
ණයහිමියෝ		310 000
වෙනත් ආදායම්		40 000
අවිනිශ්චිත ගිණුම		?
	150 000	150 000

ශේෂ පිරික්සුම පිළියෙල කිරීමෙන් පසු පහත තොරතුරු අනාවරණය කර ගන්නා ලදී.

A - ණයගැතියන්ගෙන් ලද රු. 35 000/ ක මුදල මුදල් පොතේ පමණක් සටහන් කර ඇත.

B - රු. 40 000 ක විකුණුම් ඉන්වොයිසියක් සටහන් කිරීම මග හැරී ඇත.

C - රු. 72 000 ක් වූ වේතන ගෙවීමක් රු. 27 000/ ක් ලෙස වේතන ගිණුම හර කර ඇත.

D - රු. 30 000 ක ගැනුම් ඉන්වොයිසියක් රු. 3 000/ ක් ලෙස ගැනුම් ජ'නලයේ සටහන් වීම.

E - ණයහිමියෙකුට ගෙවූ රු. 80 000/ ක් ණය හිමි ගිණුම හර කර මුදල් පොත ද හර කර තිබීම.

36. 2016 03 31 දිනට අවිනිශ්චිත ගිණුමේ ශේෂය වනුයේ,

(1) රු. 120 000 (2) රු. 14 0 000 (3) 150 000 (4) 160 000

37. ඉහත වැරදි අතරින් ශේෂ පිරික්සුමේ වෙනසට බල නොපාන වැරදි වනුයේ,

(1) A හා B ය (2) B හා D ය (3) C හා D ය (4) C හා E ය

38. ඉහත A හි සඳහන් වැරැද්ද නිවැරදි කිරීමට අදාළ නිවැරදි ජ'නල සටහන තෝරන්න.

(1) මුදල් හර 35 000
ණයගැතියෝ බැර 35 000

(2) ණයගැතියෝ හර 35 000
මුදල් බැර 35 000

(3) ණයගැතියෝ හර 35 000
අවිනිශ්චිත ගිණුම බැර 35 000

(4) අවිනිශ්චිත ගිණුම හර 35 000
ණයගැතියෝ බැර 35 000

39. ඉහත 'E' හි සඳහන් වැරැද්ද නිවැරදි කිරීමට අදාල නිවැරදි ජ'නල සටහන තෝරන්න.

(1) අවිනිශ්චිත ගිණුම හර 80 000
ණයහිමියෝ බැර 80 000

(2) මුදල් පොත හර 80 000
අවිනිශ්චිත ගිණුම බැර 80 000

(3) ණයහිමියෝ හර 160 000
අවිනිශ්චිත ගිණුම බැර 160 000

(4) අවිනිශ්චිත ගිණුම හර 160 000
මුදල් පොත බැර 160 000

40. ඉහත 'C' හි සඳහන් වරද නිවැරදි කිරීමේ දී අවිනිශ්චිත ගිණුමට අදාල ලෙජර සටහන වනුයේ,

(1) අවිනිශ්චිත ගිණුම හර 72 000 (2) අවිනිශ්චිත ගිණුම බැර 72 000

(3) අවිනිශ්චිත ගිණුම හර 45 000 (4) අවිනිශ්චිත ගිණුම බැර 45 000

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
අවසාන වාර පරීක්ෂණය 2016

10 ශ්‍රේණිය 60 - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය (නව නිර්දේශය) - II කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

වැදගත් :
- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.
- **පළමු ප්‍රශ්නයටත් I කොටසින් ප්‍රශ්න දෙකකටත් II කොටසින් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න.**

---

01. චමින්ද සිල්වා ඉදල් කොහු නිෂ්පාදනය කිරීමේ ස්වයං රැකියාවක් කරගෙන යන සමෘද්ධි ලාභියෙකි. ඔහු තමාගේ දැඩි උනන්දුව හා කැපවීම මත තමාගේ ව්‍යාපාරය වඩාත් සාර්ථක ව්‍යාපාරයක් බවට පත් කර ගැනීමට සමත් විය. ඉන් පසු ඔහුගේ ව්‍යාපාරය "චමින්ද ඉදල් කොහු නිෂ්පාදකයෝ" ලෙස ලියා පදිංචි කර විධිමත් ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාමට තීරණය කරන ලදී. පසුව තමාගේ ව්‍යාපාරයේ කටයුතු සඳහා සේවකයන් දෙදෙනෙකු බඳවා ගත් අතර මුදල් ගනුදෙනු පහසු කර ගැනීම සඳහා ජංගම ගිණුමක් ආරම්භ කිරීමට තීරණය කරන ලදී. බඳවාගත් සේවකයන්ගෙන් එක් සේවකයෙකු ව්‍යාපාරයේ සිදුවන මූල්‍ය කටයුතු වාර්තා කිරීමට යොදවන ලදි. ජංගම ගිණුම හිමි බැංකුව සෑම මසකම අවසානයේ බැංකු ප්‍රකාශය ව්‍යාපාරයට එවන ලදී. ව්‍යාපාරයට අවශ්‍ය වෙළඳ භාණ්ඩ ණයට ගැනීමත් එමෙන්ම වෙළඳ භාණ්ඩ ණයට විකිණීමේ කටයුතු වලත් ව්‍යාපාරය නිරත විය. ව්‍යාපාරයේ බොහෝ ගනුදෙනු බැංකු ජංගම ගිණුම හරහා කිරීමට කටයුතු කරන ලදී. ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා එදිරිසිංහ සමාගමෙන් රු. 60 000 වටිනා යන්ත්‍රයක් සහ රු. 30 000 ක් වටිනා පරිගණක යන්ත්‍රයක් ණය පදනම මත මිලදී ගෙන ව්‍යාපාරය ඉතා සාර්ථකව පවත්වාගෙන යන ලදී.

(1) චමින්ද ගේ ව්‍යාපාරය ලියාපදිංචි කිරීමට අදාල නීතිමය විධි විධානය කුමක්ද? අදාළ නීතිමය පනත කුමක් ද?

(2) චමින්දගේ ව්‍යාපාරය කෙරෙහි ඇල්මැති පාර්ශවයන් 04 ක් නම් කරන්න.

(3) ජංගම ගිණුම් ආරම්භ කල හැකි බැංකු කිනම් නමකින් හැඳින්වේ ද? එවැනි බැංකු දෙකක් නම් කරන්න.

(4) බැංකු ගිණුමේ අවසාන ශේෂය සහ බැංකු ප්‍රකාශයේ අවසාන ශේෂය එකිනෙකට වෙනස් වීමට බලපාන හේතු දෙකක් නම් කරන්න.

(5) බැංකු ගිණුමේ ශේෂයට වඩා බැංකු ප්‍රකාශයේ ශේෂය වැඩි විය හැකි අවස්ථාවක් දක්වන්න.

(6) ව්‍යාපාරයේ කටයුතු පවත්වාගෙන යාමේ දී වෙළඳ භාණ්ඩ ණයට ගැනීම සහ විකිණීමට අදාළ ගනුදෙනු සටහන් කරන මූලික සටහන් පොත් නම් කරන්න.

(7) ව්‍යාපාරයේ කටයුතු සඳහා රු. 60 000 ක් වටිනා යන්ත්‍රයක් ණය පදනම මත මිලට ගැනීම සටහන් කරන මූලික පොත නම් කරන්න.

(8) රු. 30 000 කට ව්‍යාපාරයේ ප්‍රයෝජනයට මිලදී ගත් පරිගණක යන්ත්‍රයේ පිරිවැය ගැනුම් ගිණුමට හර කිරීමේ වරද නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන් ලියන්න.

(9) චමින්ද සිල්වා තමාගේ ජංගම දුරකථනය භාවිතා කරමින් බැංකුව සමග ගනුදෙනු කිරීමට යොමු වුවහොත් එමගින් ඔහුට අත්වන ප්‍රතිලාභ 02 ක් දක්වන්න.

(10) රු. 60 000 ක් වටිනා යන්ත්‍රය මිලදී ගැනීමට අදාල ලෙජර් ගිණුම් පිළියෙල කරන්න. (ල. 2×10=20)

I කොටස

02. (1) අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම් දෙකක් ලියන්න.

(2) ව්‍යාපාරයක දැකිය හැකි ප්‍රධාන අරමුණු 02 ක් නම් කරන්න.

(3) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න ලියා දක්වන්න.

(අ) ව්‍යාපාරයේ අනාගත වර්ධනය පිළිබඳ ඇල්මක් දක්වන්නෝ අයිතිකරුවෝය. ( )

(ආ) අඛණ්ඩ ඇණවුම් ලබා ගැනීම ප්‍රධාන අරමුණ කරගත් පාර්ශවය නම් ගනුදෙනුකරුවන්ය. ( )

(ඉ) ව්‍යාපාර කාර්ය ඉටු කරන පුද්ගලයෝ සේවකයෝ වෙති. ( )

(ඊ) ව්‍යාපාර සැලසුම් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම, නිවැරදි තීරණ ගැනීම අයිතිකරුවන් විසින් සිදු කරයි. ( )

(4) භාණ්ඩ නිෂ්පාදනය හා සේවා නිෂ්පාදනය කරන ව්‍යාපාර දෙකක් සඳහා උදාහරණ 02 බැගින් නම් කරන්න. (ල. 2 × 4 = 8)

03. නිලූෂිකා අ: පො: ස: (සා:පෙළ) විභාගය අසමත් වූ තරුණියක්ය, උපතින්ම ඇය රූපලාවන්‍ය කටයුතු සඳහා ඇල්මක් දැක්වූ නිසා රූපලාවන්‍ය පාඨමාලාවක් හදාරන ලදී. නිලූෂිකා රූපලාවන්‍ය ආයතනයක් ආරම්භ කිරීමට කැමති බව ප්‍රකාශ කළ විට ඒ සඳහා අවශ්‍ය සියලු උපකරණ හා ස්ථානයක් තම පියා විසින් සපයා දීමට එකඟ විය. එම රූපලාවන්‍ය ආයතනය අසල තවත් රූපලාවන්‍ය ආයතනයක් මෙන්ම නර්තන ආයතනයක් පවත්වාගෙන යයි.

(1) මෙම රූපලාවන්‍ය ආයතනයට ඇති ශක්තීන් 02 ක් සහ අවස්ථා හා තර්ජන 01 බැගින් නම් කරන්න.

(2) ව්‍යාපාර පරිසරයේ ඉතා සීඝ්‍රයෙන් සිදුවන වෙනස්කම් සඳහා බලපෑ හැකි තාක්ෂණික පරිසර සාධක 04 ක් නම් කරන්න.

(3) රජය රටක ආර්ථික ප්‍රතිපත්ති තීරණය කිරීම සඳහා මැදිහත් වෙයි. ඒ අනුව රජය මැදිහත් වන ආර්ථික සාධක (කටයුතු) හතරක් නම් කරන්න.

(4) ව්‍යාපාර පරිසරය අධ්‍යයනය කිරීමෙන් ව්‍යාපාරිකයෙකුට අත්කරගත හැකි ප්‍රයෝජන 02 ක් ලියන්න. (ල. 2 × 4 = 8)

04. (1) සීමාසහිත සමාගම් වල අවාසි 02 ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(2) (අ) සමූපකාර සමිති සංවිධානයක සිටිය යුතු අවම සාමාජිකයන් සංඛ්‍යාව කොපමණ ද?

(ආ) සමුපකාර සමිති , සමිති සංවිධානයක් ප්‍රාග්ධනය රැස්කර ගන්නා ආකාරය දක්වන්න.

(3) රාජ්‍ය සංස්ථා සහ රාජ්‍ය දෙපාර්තමේන්තු වල අවාසි දෙක බැගින් වෙන වෙනම දක්වන්න.

(4) පරිගණක ආශ්‍රිත ගිණුම්කරණයේ අවාසි 02 ක් දක්වන්න. (ල. 2 × 4 = 8)

II කොටස

05. (1) (අ) ගිණුම්කරණයේ අරමුණ කුමක් ද? (ල. 01)

(ආ) වත්කමක දැකිය හැකි ලක්ෂණ 02 ක් දක්වන්න. (ල. 01)

(2) පහත සඳහන් ගිණුම් අයත්වන ගිණුම් වර්ගය සඳහන් කරන්න.

	ගිණුම	ගිණුම් වර්ගය
(a)	ප්‍රාග්ධන ගිණුම	....
(b)	මුදල් ගිණුම	....
(c)	විකුණුම්	....
(d)	වැටුප් ගිණුම	....

(ල ½ x 4 = 2)

(3) අනිල්ගේ ව්‍යාපාරයේ 2016 අගෝස්තු මාසය තුල සිදුවූ ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපෑ අන්දම පහත දැක්වේ.

දිනය	තොගය +	උපකරණ +	ණයගැතියෝ +	මුදල් =	ප්‍රාග්ධනය +	ණය හිමියෝ
8/1 ශේෂය	50 000	30 000	10 000	10 000 =	?	30 000
8/2				+ 30 000	+ 30 000	
8/10	(10 000)		+ 15 000		+ 5 000	
8/16	+ 7 000			(7 000)		
8/20	(2 000)				(2 000)	
8/25				(10 000)	(10 000)	
8/28				(10 000)		(10 000)

The National e-Learning Portal for The General Education

අවශ්‍ය වන්නේ,

(අ) එක් එක් දිනයේ සිදුවී ඇති ගනුදෙනුව අගයන් සහිතව වෙන වෙනම ලියන්න. (ල. 03)

(ආ) 2016 08 31 දිනට අයිතිකරුගේ හිමිකම ගණනය කරන්න. (ල. 01)

(4) යුවනිගේ ව්‍යාපාරයේ 2016 සැප්තැම්බර් මාසයේ සිදු කරන ලද සුළු මුදල් ගෙවීම් වලට අදාළ තොරතුරු පහත දැක්වේ.

2016/09/01 ප්‍රධාන මුදල් භාරකරුගෙන් මුදල් ලැබුණා රු. 2 000

09/2 ලිපි ද්‍රව්‍ය මිලදී ගත්තා රු. 75

09/4 සංග්‍රහ වියදම් රු. 150

09/5 තැපැල් ගාස්තු රු. 80

09/10 ගමන් ගාස්තු රු. 120

09/13 මුද්දර ගත්තා රු. 100

09/15 සංග්‍රහ වියදම් රු. 75

10/01 අග්‍රිමය ප්‍රතිපූර්ණය කළා

අවශ්‍ය වන්නේ,

ඉහත ගනුදෙනු ඇතුළත් කර විශ්ලේෂණ තීරු සහිත සුළු මුදල් පොත පිළියෙල කිරීම. (ල. 04)

06. (1) (අ) මූලික සටහන් පොත් යනුවෙන් හැඳින්වෙනු යේ මොනවාද? (ල. 01)

(ආ) මූලාශ්‍ර ලේඛනවල ප්‍රයෝජන 02 ක් ලියන්න. (ල. 01)

(2) පහත දැක්වෙන එක් එක් ගනුදෙනුව සටහන් කරන මූලික සටහන් පොත හා උපයෝගී කර ගන්නා මූලාශ්‍ර ලේඛන දක්වන්න.

ගණුදෙනුව	මූලික සටහන්පොත	මූලාශ්‍ර ලේඛන
(a) විදුලි වියදම් ගෙවීම		
(b) ණයට භාණ්ඩ මිලදී ගැනුම්		
(c) බැංකුවේ මුදල් තැන්පත් කිරීම		
(d) ස්ථාවර වත්කමක් ණයට ගැනීම		

(ල. ½ × 4)

(3) නාරද සමාගමේ 2016 ඔක්තෝබර් මාසයේ පහත සඳහන් ගනුදෙනු සිදුවිය.

2016/10/01 ප්‍රාග්ධනය වශයෙන් රු. 200 000 යොදා ව්‍යාපාරයක් ආරම්භ කළා.

10/2 අත්පිට මුදලට භාණ්ඩ ගත්තා රු. 55 000

10/5 රු. 20 000 ක් වටිනා ලී බඩු උපකරණ දඹුලු ලී බඩු සමාගමෙන් ණයට ගත්තා

10/9 අත්පිට විකුණුම් රු. 75 000

10/11 සමන්ගෙන් ණයට භාණ්ඩ මිලදී ගැනුම් රු. 20 000

10/12 විදුලි බිල්පත ගෙව්වා රු. 2 000

10/15 නිමල්ට ණයට භාණ්ඩ විකුණුම් රු. 15 000

10/16 සමන්ගේ ණය ගෙව්වා රු. 4500 ලද වට්ටම රු. 500

අවශ්‍ය වන්නේ,

(අ) ඉහත ගනුදෙනු සියල්ල මූලික පොත්වල සටහන් කරන්න.

(ආ) මූලික සටහන් පොත්වල ගනුදෙනු ලෙජරයට පිටපත් කර ලෙජරය තුලනය කරන්න. (ල. 04)

(4) 2016 / 10 / 31 දිනට තරිඳුගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය රු. 15 000 විය. එහෙත් එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය වෙනස් අගයන් දක්නට ලැබිණි. වෙනසට හේතු සෙවීමේ දී පහත සඳහන් කරුණු අනාවරණය විය.

(1) ඔක්තෝබර් මාසයේ බැංකුවේ තැම්පත් කළ නමුත් නිෂ්කාෂණය නොවූ චෙක්පත්වල වටිනාකම රු. 18 000.

(2) නිකුත් කර ඇතත් බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් වල වටිනාකම රු. 21 000

(3) ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සඳහන් නොමැති අයිතම

(a) බැංකු ගාස්තු රු. 500

(b) ණයගැති ප්‍රේෂණ රු. 12 000

(c) ස්ථාවර නියෝග මත රක්ෂණ වාරිකය ගෙවීම් රු. 10 000

අවශ්‍ය වන්නේ,

(අ) 2016 ඔක්තෝබර් 31 දිනට සංශෝධිත බැංකු ගිණුම

(ආ) 2016 ඔක්තෝබර් මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශය (ල. 04)

07. (1) (අ) චෙක්පත් අගරු වීම යනු කුමක් ද? (ල. 01)

(ආ) "මුදල් වට්ටම්" යන්න පැහැදිලි කරන්න. (ල. 01)

(2) (අ) ජංගම දුරකථන බැංකුකරණයේ වාසි 02 ක් ලියන්න. (ල. 01)

(ආ) වර්තමානයෙ භාවිතවන ගිණුම්කරණ මෘදුකාංග පැකේජ 02 ක් නම් කරන්න. (ල. 01)

(3) සංසලාගේ ව්‍යාපාරයේ 2016/09/31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමේ හර හා බැර තීරුවල එකතුව එකිනෙකට සම නොවූයෙන් එහි වෙනස වූ රු. 4200 /= අවිනිශ්චිත ගිණුමට බැර කරන ලදී. පසුව කළ සොයා බැලීමක දී පහත වැරදි සොයාගෙන ඇත.

(අ) රු. 6 000 ක රක්ෂණ වාරික ගෙවීම රක්ෂණ වාරික ගිණුමේ නිවරදිව සටහන් කර ඇතත් මුදල් පොතේ සටහන් වී නැත.

(ආ) රු. 3 200 ක කඩකුලී ශේෂ පිරික්සුමට ගෙන නැත.

(ඇ) විකුණුම් ගිණුම බැර පැත්ත රු. 600 ක් වැඩිපුර එකතු කර ඇත.

(ඉ) රු. 20 000 ක් වූ මෝටර් රථ අලුත්වැඩියා වියදම් මෝටර් රථ ගිණුමට හර කර ඇත.

(ඊ) රු. 5 000 ක් වූ වැටුප් ගෙවීම විදුලි වියදම් ගිණුමට හර කර ඇත.

(උ) ලද කොමිස් රු. 1 000 ක් මුදල් පොත හර කර, ලද කොමිස් ගිණුමට ද හර කර ඇත.

අවශ්‍ය වන්නේ,

(අ) වැරදි නිවැරදි කිරීම සඳහා ජ'නල් සටහන් (ල. 04)

(ආ) අවිනිශ්චිත ගිණුම (ල. 04)

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව **අවසාන වාර පරීක්ෂණය 2016**

10 ශ්‍රේණිය **ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**

පිළිතුරු පත්‍රය - I කොටස

1 -(2)	2 -(3)	3 -(3)	4 -(1)	5 -(1)	6 -(2)	7 -(2)	8 -(3)	9 -(3)	10 -(2)
11-(4)	12 -(1)	13 -(1)	14 -(4)	15 -(2)	16 -(2)	17 -(4)	18 -(2)	19 -(3)	20 -(1)
21-(1)	22 -(3)	23 -(3)	24 -(3)	25 -(3)	26 -(3)	27 -(2)	28 -(1)	29 -(3)	30 -(3)
31-(1)	32 -(2)	33 -(4)	34 -(2)	35 -(4)	36 -(3)	37 -(2)	38 -(4)	39 -(4)	40 -(4)

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

II පත්‍රය - I කොටස

01. (1) 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ආඥා පනත (ල. 02) (2) අයිතිකරුවන්, සේවකයන්. ගනුදෙනු කරුවන්, සැපයුම්කරුවන් (ල ½ x 4) (3) වානිජ බැංකු (ල. 01) ඕනෑම වානිජ බැංකු 02 (ල.01) (4) * තැම්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක් * නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක් (ල.02) (5) ඍජු ණයගැති ප්‍රේෂණ, ලාභාංශ, ආයෝජන ආදායම් (ල.02) (6) ●ණයට ගැනුම් ගැනුම් ජ'නලය ● ණයට විකුණුම් විකුණුම් ජ'නලය (ල. 02) (7) පොදු ජ'නලය (ල. 02) (8) ■ පරිගණක යන්ත්‍ර ගිණුම හර 30 000 ගැනුම් ගිනුම් බැර 30 000 (09) ★ බැංකුවට නොගොස් ගිණුමේ ශේෂය දැන ගත හැකි වීම. ★ විවිධ ගෙවීම් කටයුතු සිදු කළ හැකි වීම. (ල.02)

(10)

යන්ත්‍ර ගිණුම

එදි. ස. ගි. 60 000	

එදිරිසිංහ සමාගමේ ගිණුම

	යන්ත්‍ර ගිණුම 60 000

II කොටස

01. (1)

අවශ්‍යතා	වුවමනා
▫ පොදු වීම	▫ විවිධ වීම
▫ සීමිත වීම	▫ අසීමිත වීම
▫ නිර්මාණය කළ නොහැකි වීම	▫ නිර්මාණය කළ හැකි වීම (ඕනෑම කරුණු 02 කට ල.02)

(2) * ලාභ ඉපයීම * පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම. (කරුණු 02 ට ලකුණු 02 යි)

(3) අ සත්‍යයි ආ අසත්‍යයි ඉ සත්‍යයි ඊ අසත්‍යයි (ල. ½ × 4=2)

(4) ඕනෑම නිවැරදි ව්‍යාපාර 02 කට ලකුණු දෙන්න.

02. (1) **ශක්තීන්** ★ පියා උදව් කිරීම ★ රූපලාවන්‍ය කටයුතු වලට නිලූෂිකා ඇල්මක් දැක්වීම.

අවස්ථා අසල නර්තන ආයතනයක් තිබීම.

තර්ජන අසල වෙනත් රූපලාවන්‍ය ආයතනයක් තිබීම. (½×4 =2)

(2) 01. පරිගණක තාක්ෂණයේ දියුණුව 02. අන්තර් ජාලය භාවිතා කිරීම 03. නැනෝ තාක්ෂණය 04. ඩිජිටල් තාක්ෂණය (ල. ½ × 04 = 02)

(3) (1) පොලී අනුපාතය (2) උද්ධමනය (3) ආදායම් ව්‍යාප්තිය (4) රැකියා නියුක්තිය (5) විදේශ විනිමය අනුපාත (6) ජාත්‍යන්තර සබඳතා (7) ඉතුරුම් (ල. ½ × 4 = 02)

(4) (1) තරගකාරීත්වයට සාර්ථක මුහුණ දීම සඳහා (2) අවස්ථා හඳුනාගෙන ඉන් ප්‍රයෝජන ගැනීමට. (3) ශක්තීන් හඳුනාගෙන ඉන් ප්‍රයෝජන ගැනීමට (4) දුර්වලතා හඳුනාගෙන ඒවා මඟහරවා ගැනීමට. (ල. 1 × 2 = 02)

03. (1) (i) ★ නීතිමය විධි විධාන අධික වීම. (2) ★ ලාභය සහ අයිතිය බෙදීයාම (1 ×2 = 02)

(2) (අ) 10 (ආ) සාමාජික අරමුදලින් ප්‍රාග්ධනය රැස් කරයි. (1 × 2 = 02)

(3) අවාසි: රාජ්‍ය සංස්ථා (1) තීරණ ගැනීමේ ස්වාධීනත්වය නැති විම.
(2) රජයේ මූල්‍ය රෙගුලාසි වලට යටත් වීම.

දෙපාර්තමේන්තු: (1) රජයේ ආයතන සංග්‍රහය, මූල්‍ය නීති සංග්‍රහයට අනුව කටයුතු කිරීමට සිදුවීම.
(2) සේවයේ අතිරික්ත සේවකයන් නිරත නිසා ශ්‍රම පිරිවැය වැඩි වීම. (ල. ½ x 4 = 2)

04. (1) විදුලිය ඇණ හිටීම, පරිගණක වෛරස හා අනෙකුත් තාක්ෂණික දෝෂ නිසා දත්ත නැතිවීමේ අවදානම

(2) පරිගණක දත්ත ලබා ගැනීමේ හා වෙනස් කිරීමේ අවදානමක් තිබීම.

(3) පරිගණක මෘදුකාංග මිල අධික වීම. (ල. 1 × 2 = 02)

05. (1) (අ) ව්‍යාපාරික ඒකකයක් කෙරෙහි ඇල්මැති පාර්ශව වලට තීරණ ගැනීමේ දී ප්‍රයෝජනවත් වන තොරතුරු සැපයීම. (ල. 01)

(ආ) * අතීත ගනුදෙනුවක ප්‍රතඵලයක් ලෙස ඇති වීම.
* ව්‍යාපාරයෙ පාලනයට යටත් වීම.
* අනාගතයේදී ව්‍යාපාරයට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම. (ල. ½ ×2 = 01)

(2) (a) හිමිකම් ගිණුම (b) වත්කම් ගිණුම (c) ආදායම් ගිණුම (d) වියදම් ගිණුම
(ල. ½ ×4 = 02)

(3) 8/2 අමතර ප්‍රාග්ධනය ලෙස රු. 30 000 යෙදවීම.
8/10 රු. 10 000 පිරිවැය වූ භාණ්ඩ තොගයක් රු. 15 000 ණයට විකිණීම.
8/16 විකිණීම සඳහා රු. 7 000 ක් වටිනා භාණ්ඩ තොගයක් මිලට ගැනීම.
8/20 අනිල් තම පෞද්ගලික ප්‍රයෝජනයට රු. 2 000/ ක් වටිනා භාණ්ඩ රැගෙන යාම.
8/25 සේවක වැටුප රු. 10 000 ක් ගෙවීම.
8/28 රු. 10 000 ණය හිමියන්ට ගෙවීම. (ල. ½ ×6 = 03)
(ආ) 93,000/ (ල. 01)

(4)
යුවනිගේ ව්‍යාපාරයේ
2016 සැප්තැම්බර් මාසයේ සුළු මුදල් පොත

ලැබීම්	ස. පි.	දිනය	විස්තරය	වි. අ.	ගෙවීම්	විශ්ලේෂණ තීරු ලෙජරය: ලිපි ද්‍රව්‍ය	සංග්‍රහ වියදම්	තැපැල්	ගමන් වි.		
2 000		9/1	මුදල්								
		9/2	ලිපද්‍රව්‍ය		75	75 ½					
		9/4	සංග්‍රහ වියදම්		150		150 ½				
		9/5	තැපැල් ගාස්තු		80			80 ½			
		9/10	ගමන් ගාස්තු		120				120 ½		
		9/13	මුද්දර		100			100 ½			
		9/15	සංග්‍රහ වියදම්		75		75 ½				
					600 ½	75	225	180	120		
		9/30	ප/ගෙ/ශේ.		1 400						
2 000					2 000						
1 400		10/1	ඉ/ගෙ/ශේ.								
600 ½			මුදල්								

06. (1) (අ) ව්‍යාපාර ගනුදෙනු ගිණුම්වල සටහන් කිරීමට පෙර මුලින්ම සටහන් කරන පොත් මූලික සටහන් පොත් ලෙස හැඳින්වේ.
උදා: මුදල් පොත, බැංකු ගිණුම, සුළුමුදල් පොත, ගැනුම් ජ'නලය, විකුණුම් ජ'නලය. (ල. 01)
(ආ) * ගනුදෙනුවට අදාළ ආරම්භක ලියවිල්ල ලෙස යොදාගත හැකි වීම.
* ගනුදෙනුව සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂියක් ලෙස භාවිත කළ හැකි වීම.
(නිවැරදි පිළිතුරට ලකුණු දෙන්න) (ල. 01)

(2)

	මූලික සටහන් පොත	**මූලාශ්‍ර ලේඛනය**
(a)	මුදල් පොත	ගෙවීම් වවුචර
(b)	ගැනුම් ජ'නලය	ගැනුම් ඉන්වොයිසිය.
(c)	බැංකු ගිණුම	තැන්පත් කිරීමේ කුවිතාන්සි
(d)	පොදු ජ'නලය	ජ'නල් වවුචර

(3) (අ)
මුදල් පොත

දිනය	ල. අ.	විස්තරය	වට්ටම්	මුදල්	දිනය	ව. අ.	විස්තරය	වට්ටම්	මුදල්	
10/1		ප්‍රාග්ධනය	½ {	200 000	10/2		ගැනුම්		55 000	} ½
10/9		විකුණුම්		7 500	10/12		විදුලිය		2 000	
					10/16		සමන්	500	4 500	½
					10/30		ප/ගෙ/ශේෂය		146 000	½
				207 500				500	207 500	

ගැනුම් ජ'නලය

දිනය	ඉ. අ.	සැපයුම්කරු	මුළු වටි.	ලෙ.පි.	
10/11		සමන්	20 000		½
		ගැනුම් ගිණුමට හර කළා	20 000		

විකුණුම් ජ'නලය

දිනය	ඉ. අ.	විකුණුම්කරු	වටිනාකම	ලෙ.පි.	
10/15		නිමල්	15 000		½
		විකුණුම් ගිණුමට බැර කළා	15 000		

පොදු ජ'නලය

දිනය	විස්තරය	ලෙ.පි.	හර	බැර
10/05	ලීබඩු ගිණුම හර		20 000	
	දඹුලු ලීබඩු සමා.			20 000
	(දඹුලු ලී බඩු සමාගමෙන් රු. 20 000 ලී බඩු ණයට ගැනීම)			

(1)

ප්‍රාග්ධන ගිණුම

10/30 ප/ගෙ/ශේ.	200 000	10/1 මුදල්	200 000
	200 000	(1)	200 000
		11/1 ඉ/ගෙ/ශේ.	200 000

විකුණුම් ගිණුම

(2)		10/9 මුදල්	75 000
10/30 ප/ගෙ/ශේ.	90 000	10/30 නිමල්	15 000
	90 000		90 000
		11/1 ඉ/ගෙ/ශේ.	22 500

ගැනුම් ගිණුම

10/02 මුදල්	55 000	ප/ගෙ/ශේ.	75 000
10/11 සමන්	20 000	(2)	
	75 000		75 000

විදුලිය ගිණුම

10/12 මුදල්	2 000	10/30 ප/ගෙ/ශේ.	2 000
(1)	2 000		2 000
11/1 ඉ/ගෙ/ශේ.	2 000		

සමන් ගිණුම

10/16 මුදල්	4 500	10/11 ගැනුම්	20 000
ල.ව.	500	(2)	
10/30 ප/ගෙ/ශේ.	15 000		
	20 000		20 000
		ඉ/ගෙ/ශේ.	15 000

ලද වට්ටම්

		10/16 සමන්	500
10/30 ඉ/ගෙ/ශේ.	500	(1)	
	500		500
		11/1 ඉ/ගෙ/ශේ.	500

නිමල් ගිණුම

10/30 විකුණුම්	15 000	10/30 ප/ගේ/ශේ	15 000
(1)			
	15 000		15 000
11/1 ඉ/ගෙ/ශේ.	15 000		

ලීබඩු ගිණුම

10/5 දඹුලු ලී බඩු	20 000	10/3 ප/ගෙ/ශේ.	20 000
(1)			
	20 000		20 000
11/1 ඉ/ගෙ/ශේ.	20 000		

දඹුලු ලී බඩු සමාගම

		10/5 ලී බඩු	20 000
10/30 ප/ගෙ/ශේ.	20 000	(1)	
	20 000		20 000
		11/1 ඉ/ගෙ/ශේ.	20 000

06 (3) (අ) ලකුණු 04
(ආ) ලකුණු 12
මුළු ලකුණු 16
(අවසන් ලකුණු 16/4 = 04)

The National e-Learning Portal for The General Education

(4) සංශෝධිත බැංකු ගිණුම

දිනය	විස්තරය	ස.පි.	වටිනාකම	දිනය	විස්තරය	ස.පි.	වටිනාකම	
10/31	ඉ/ගෙ/ශේ		15 000		බැංකු ගාස්තු		500	½
	ණයගැති ප්‍රේෂණ	½	12 000		ස්ථාවර නියෝ.		10 000	½
					ප/ගෙ/ශේ.		16 500	½
			27 000				27 000	

බැංකු සැසඳුම් ප්‍රකාශය

සංශෝධිත බැංකු ගිණුමේ ශේෂය		16 500	
+ නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්	21 000	21 000	(1)
		37 000	
තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්	18 000	18 000	(1)
බැංකු ප්‍රකාශයට අනුව ශේෂය		19 500	

(ල. 04)

07\. (1) (අ) චෙක්පත් අවධිමත් ව ලියා තිබීම. ජංගම ගිණුමේ මුදල් නොතිබීම, චෙක්පතට තබා ඇති අත්සන ආදර්ශ අත්සනට වඩා වෙනස් වීම, ආදී හේතූන් මත බැංකුව විසින් චෙක්පතට ගෙවීම ප්‍රතික්ෂේප කිරීම. (ල. 01)

(ආ) නියමිත කාලය තුල ණය බේරුම් කරන විට ණය මුදලෙන් කරනු ලබන අඩු කිරීම මුදල් වට්ටම් ලෙස හැඳින්වේ. (ල. 01)

(2) (අ), (ආ) සුදුසු පිළිතුරු සඳහා ලකුණු පිරිනමන්න. (ල. 02)

(3) (අ) පොදු ජ'නලය

දිනය	විස්තරය	හර	බැර	
09/30	අවිනිශ්චිත ගිණුම හර	6 000		
	මුදල් ගිණුම		6 000	(½)
	(රක්ෂණ වියදම් ගෙවීම මුදල් ගිණුමේ සටහන් නොවීමෙන් වූ වරද නිවැරදි කිරීම)			
	....	3 200		
	අවිනිශ්චිත ගිණුම		3 200	(1)
	(කඩ කුලී ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමට නොගැනීමෙන් වූ වරද නිවැරදි කිරීම)			
	විකුණුම් ගිණුම හර	600		
	අවිනිශ්චිත ගිණුම		600	(½)
	(රු. 600 විකුණුම් වැඩියෙන් එකතු කිරීමෙන් වූ වරද නිවැරදි කිරීම.)			
	මෝටර් රථ අළුත් වැඩි. ගිණුම හර	20 000		
	මෝටර් රථ ගිණුම		20 000	(½)
	(මෝටර් ර. අ. වැඩියා මෝ. ර. ගිණුමට හර කිරීමෙන් වූ වරද නිවැරදි කිරීම)			
	වැටුප් ගිණුම හර	5 000		
	විදුලි වියදම් ගිණුම		5 000	(½)
	(රු. 5 000 ක් වැටුප් ගෙවීම විදුලි වියදම් ගි. හර කිරීමෙන් වූ වරද නිවැරදි කි.	2 000		
	අවිනිශ්චිත ගිණුම		2 000	(1)
	ලද කොමිස් ගිණුම			
	(කොමිස් ලැබීම හර කිරීමෙන් වූ වරද නිවැරදි කිරීම)			

(ආ) අවිනිශ්චිත ගිණුම

මුදල්	(1)	6 000	ශේෂය	4 200	
ලද කොමිස්	(1)	2 000	....	3 200	(1)
			විකුණුම්	600	(1)
		8 000		8 000	

The National e-learning Portal for The General Education